# 26. අමාවතුර ආකෘතිය පිළිබඳ විමර්ශනයක්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කතංගමුවේ රාහුල හිමි
බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය

පශ්චාත් අනුරාධපුර යුගයේ ඉහළින් නැඟ ආ හින්දු සමයානුගත සර්වව්‍යාපී වූ, සර්ව බලධාරී වූ ඊශ්වර නිර්මාණවාදී සංකල්ප හා බෝධිසත්ව චරිතයේ උත්තමාංග භූවා දක්වන මහායාන දර්ශනයේ සංකල්ප එතෙක් පැවැති ලාංකේය බෞද්ධ සංස්කෘතික ක්‍රියාදාමය තුළ විශාල පෙරළියක් ඇති කරන්නට විය. ජීව-අජීව ලෝකයේ ඇතිවීම පැවතීම හා නැතිවීම මැවුම්කාර දෙවියන් වෙත භාරකිරීම හින්දු දහමේ මූලික හරය යි. යථාභූතවාදී දර්ශනයෙන් ලෝක ස්වභාවය හැඳින ගත් ලාංකික බෞද්ධයෝ අසදෘශ මේ මහා  බලසම්පන්න දෙවියන්ගේ පිහිට ආරක්ෂාව කෙරෙහි ක්‍රමයෙන් යොමුවන්නට වූ හ. යථාර්ථවාදී දෘෂ්ටියෙන් බැහැර ව නිර්මාණවාදී දර්ශනයෙන් මුළා වූ තත් බෞද්ධ ජනතාව එමගින් මුදවා ගැනීම එවකට ජීවත් වූ උගත්  බහුශ්‍රැත ගිහි පැවිද්දන්ගේ කාර්යභාරය විය. එයට අවශ්‍ය විකල්ප ක්‍රම තෝරාගන්නට සිදු විය. බුදුන් වහන්සේ දේවාති දේව,  බ්‍රහ්මාති බ්‍රහ්ම උත්තම ගුණයන්ගෙන් යුත් අසම සම සාස්තෘවරයා බව ලොවට කියන්නට තත්කාලීන ලේඛකයෝ ද සිය පන්හිඳ මෙහෙය වූ හ. බුදුන් වහන්සේගේ අසදෘශ මහා පෞරුෂය, ධර්මකාය සම්පත්තිය, සෘද්ධි ප්‍රාතිහාර්ය බලය, රූපකාය සම්පත්තිය මෙන් ම නව අරහාදී බුදුගුණ අතිශය වර්ණනාවෙන් යුක්ත ව ග්‍රන්ථාරූඪ කළ හ. අතුල්‍ය වූ අචේද්‍ය වූ, අවාච්‍ය වූ තෙරුවන් ගුණ වර්ණනා කිරීමෙන්  තත් ලේඛකයෝ මිසදිටුගත් බෞද්ධ ජනතාව තෙරුවන්හි සරණ පරායන ඇත්තන් බවට පත්කරවීමට උත්සුක වූ හ.  එහි ප්‍රතිඵල අතර අමාවතුර, බුත්සරණ, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය ආදී සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථ රාසිය ජාතියේ හා දර්ශනයේ අනන්‍යතාව තහවුරු කෙරෙමින් සිටී.

මෙහිදී  අපගේ අරමුණ වන්නේ පරිසමාප්ත ආකෘතියෙන් යුත් ආදිතම සිංහල ගද්‍ය කාව්‍යයේ  තත් ආකෘතික ස්වභාවය පිළිබඳ ව විමසා බැලීම යි. නව අරහාදී බුදුගුණ අතර සවැනි බුදු ගුණය වන පුරිස දම්ම සාරථී ගුණය වස්තු විෂය කරගත් ගුරුළුගෝමීන් අමාවතුර රචනා කරන ලදී. තම වස්තු විෂය සඳහා වඩාත් යෝග්‍ය කතා පුවත් පමණක් ම තෝරාගැනීමට ගුරුළුගෝමීහු නිරන්තරයෙන් උත්සාහ ගත් හ.  ත්‍රිපිටකයේ නොයෙක් තැනින් එකතු කරගත් කථා පුවත් වලින් පුරිස

ධම්ම සාරථී පද වර්ණනාව නිර්මාපිතය. වෙනත් ගත් කතුවරුන් මෙන් කියූ දේ, නැවත නැවතත් කියමින් පාඨකයා වෙහෙසට පත්කරවීමට ගුරුළුගෝමීන් අකමැති විය. එබැවින් ඔහුගේ රචනා රීතිය සරල රචනා නියරක් විය. පෙළ දහමත් පෙළ භාෂාවත් ඉතා සමීප ව ආශ්‍රය කරගත් අමාවතුර හුදු පරිවර්තන ස්වරූපයක් නොගන්නේ කතුවරයාගේ සරල වර්ණනා රීතිය නිසයි. තමන් කියන්නට යන දේ සරලව නිරවුල් ව ප්‍රකාශ කිරීම ගුරුළුගෝමීන් අමාවතුරේ දී යොදාගත් ක්‍රමයයි.

අමාවතුර ආරම්භ කරන්නේ පිළිවෙල වූ ආකෘතික ප්‍රතිඥා පාඨයකිනි. කිසිම අවස්ථාවකදීවත් එම ආකෘතිය ප්‍රතිඥා පාඨයෙන් බැහැර නොවී ය.

පාඨක පිරිස, වස්තු විෂය, හා කතුවරයාගේ ග්‍රන්ථකරණයේ අභිලාසය ප්‍රතිඥා පාඨයෙන් තීව්‍ර කෙරෙයි. බුදුන් වහන්සේ අදාන්තයන් දමනය කිරීමෙහිලා උපයෝගී කරගත් විවිධ ක්‍රමෝපායයන් ඇතුළත් කතා ප්‍රවෘත්ති අනුපිළිවෙලකට ඉදිරිපත්කරන බව කතුවරයාගේ ප්‍රතිඥා පාඨයෙන් ධ්වනිත කෙරෙයි. තම සිතේ දරාගෙන සිටි පිළිවෙල කවරක් ද යන්න තත් පාඨය කියවන කා හට වුව ද අවබෝධ කර ගැනීම දුෂ්කර නො වේ.

ඉතිපි සො භගවා ..............බුද්ධො භගවා යනු විස්තර කරත් බුදු ගුණ අනන්ත වන බැවින් නව ගුණ හැම කියත් නො පිළිවතින් එහි පුරිස ධම්ම සාරථී යන පදය ගෙනැ අප බුදුන් පෙරුම් පුරා බුදුවැ දෙව්රම් වෙහෙර පිළි ගෙනැ එහි වෙසෙමින් තුන් ලෙව්හි සැරිසැරූ විෂම පුරුෂයන් දමා අමාමහ නිවන් පැමිණ වූ සේ නොවියත් හුදී ජනන් සඳහා සියබසින් මා විසින් සැබෙවින් දක්වනු ලැබේ. (1)

බුදු ගුණ අචින්ත්‍යයයි. නව අරහාදී බුදුගුණ අතර සවැනි බුදු ගුණය වූ පුරිස දම්ම සාරථී ගුණය පමණක් තමා තෝරාගන්නා බව කතුවරයාගේ ප්‍රතිඥාවයි. තම ග්‍රන්ථකරණයේ අරමුණ, වස්තු විෂය, වස්තු විෂයෙහි කාල පරාසය මෙන් ම තමාගේ රචනා විලාසය මේ එක් ම ප්‍රතිඥා පාඨයට ඇතුළත් කොට ඇත. ග්‍රන්ථකරණයේ නිමිත්ත, ප්‍රයෝජනය හා පාඨක පිරිස නිරතුරු සිහියේ තබාගත් ගුරුලුගෝමීහු කිසි ම විටෙක තම ප්‍රතිඥා පාඨයෙන් බැහැර නොවූ හ.

බුදුන් වහන්සේගේ නව ගුණ අතර පුරිස දම්ම සාරථී ගුණය තේමා කර ගන්නට කතුවරයා මෙහෙය වූ කාරණය යුග අවශ්‍යතාව යි. ඊශ්වර නිර්මාණවාදී සංකල්පයන්ට ගැති වූ බෞද්ධ ජනයාට බුදුන් වහන්සේ දේවාති දේව, බ්‍රහ්මාති බ්‍රහ්ම වූ අයුරු ප්‍රකාශ කරන්නට ඉතා වැදගත් ම බුදු ගුණය පුරිස දම්ම සාරථී ගුණය යි. එමතු ද නො ව උන් වහන්සේගේ කාරුණික ආත්ම පරිත්‍යාගශීලී බව මෙන් ම ඍද්ධි විෂය හුවා දක්වන්නට ඉතා ම යෝග්‍යතම බුදු ගුණය නම් පුරිස දම්ම සාරථී ගුණය යි.



අමාවතුරෙහි පරිච්ඡේද දහ අටකි. පළමු පරිච්ඡේද දෙක මුළු ග්‍රන්ථයට ම ප්‍රවේශයක් වැන්න. කතුවරයා එම පරිච්ඡේද දහ අට නම් කරන්නේ මෙසේ ය.

1. දුර්දාන්ත දමනය
2. ස්වසන්තාන දමනය
3. පරසන්තාන දමනය
4. ගහපති දමනය
5. බ්‍රාහ්මණ දමනය
6. රාජ දමනය
7. චෝර දමනය
8. පරිබ්‍රාජක දමනය
9. මානවක දමනය
10. දිගම්බර දමනය
11. ජටිල දමනය
12. තාපස දමනය
13. භික්ෂු දමනය
14. නාග දමනය
15. යක්ෂ දමනය
16. අසුර දමනය
17. දේව දමනය
18. බ්‍රහ්ම දමනය

කතුවරයා ප්‍රතිඥා පාඨයේ දී අප බුදුන් පෙරුම්පුරා යනුවෙන් සඳහන් කරන්නේ පළමු පරිච්ඡේදය සිහියේ තබාගෙනය. බෝසත් ආත්මභාවයන් පෙරුම්පුරා යන පදයේ අර්ථයයි. ඒ අනුව අමාවතුරේ පළමු පරිච්ඡේදය ජාතක කථා සංක්ෂිප්තයක් වශයෙන් හැඳින්වීමට පුළුවන. බුදුන් වහන්සේ බෝසත් ආත්මභාවයන්හි දී පවා අදාන්තයන් දමනය කළ අයුරු එම පරිච්ඡේදයෙන් සිහිපත් වෙයි. මෙහිදී කතුවරයා ජාතක කතා 189ක් පමණ නාමික ව දක්වයි. විවිධ අවස්ථාවල දී විවිධ අයුරෙන් විෂම වූ සත්ත්වයන් දමවාලූ අයුරු දැක්වීමෙන් අනතුරු ව කතුවරයා එම පරිච්ඡේදය අවසන් කරන්නේ මෙසේ ය.

> "සතුන් ශීලාදී ගුණයෙහි පිහිටවමින් මෙසේ බෝසත් කල්හි මැ පුරිස දම්ම සාරථී වන බැවින් නො එක් දෑ කෙළ සුවහස්හි දුර්දාන්ත සත්ත්වයන් දමා ශීල සමාධි ප්‍රඥා ලක්ෂණ ගුණ ධර්මයන් පිසමින් සත්කෘත්‍යාභ්‍යාස නෛරන්තරාභ්‍යාස දීර්ඝකාලාභ්‍යාස විසින් බෝධිසම්භාර ධර්මයන් මුහුකුරුවමින් දැමි දමනු සඳහා සර්වඥාණ ගබ ගන්වා ගෙනැ වෙසතුරු අත්බැවින් සැවැ තුසීපුරයෙහි උපන්හු (2)

දෙවන පරිච්ජේදය නම් කරන්නේ "ස්වසන්තාන දමන" යනුවෙනි. තත් පරිච්ජේදයේ අන්තර්ගතය වන්නේ බෝසතුන් තුසිත පුරයෙහි ඉපදීම පටන් ලොව්තුරා බුද්ධත්වයට පැමිණ උදාන වාක්‍ය ප්‍රකාශ කරන තෙක් විස්තරයයි. තුසිත දෙවියන් බෝසතුන්ගෙන් කළ ඉල්ලීම, මහාමායා දේවිය දුටු සිහිනය, බෝසතුන් මව්කුස පිළිසිඳ ගැනීම, කුමාර උප්පත්තිය, නම් තැබීම, වප් මඟුල, ශිල්ප දැක්වීම, අභිනිෂ්ක්‍රමණය, සුජාතාවන්ගේ කිරිපිඬු දානය, මාර පරාජය, හා බුද්ධත්වයට පත්වීම ආදී සිදුහත් චරිත කථාව ස්වසන්තාන දමන නම් දෙවන පරිච්ජේදය තුළ අන්තර්ගතය. බුදුන් වහන්සේ අනුන් දමනය කළ පරිද්දෙන් ම පමණක් පුරිස දම්ම සරථී නොවන බව හඟවමින් පාඨක ජනයාගේ සැදැහැසිත් වර්ධනය කරවීමට ගත් උත්සාහය මේ පරිච්ජේදයෙන් පෙනේ. අනුන් දමනය කරවීමට තමන් දැමී සිටිය යුතුය. තමන් දැමීම ඉතා දුෂ්කරය. දුෂ්කර පරිත්‍යාගයෙන් හා ක්‍රියාවන්ගෙන් තමන් වහන්සේ ද දමනය වූ අයුරු දැක්වෙන සිදුහත් චරිත කතාව නො දක්වා තම වස්තු විෂය ඉදිරියට විකාශය කිරීමට කතුවරයා උත්සාහ ගත්තේ නම් එය කතා වින්‍යාසයට හානිකරය. එබැවින් ම කතුවරයා බෝසතුන් සිදුහත් ආත්ම භාවයේ දී තම සන්තානය දමනය කරගත් අයුරු දෙවැනි පරිච්ජේදයෙන් විස්තර කොට ඇත. එම පරිච්ජේදය නම් කිරීමේ දී පවා කතුවරයා ප්‍රවේශම් වී ඇති අයුරු ප්‍රශස්තය. ප්‍රතිඥා පාඨයේ දී බුදුව යන පදය වෙන්කොට ඇත්තේ මෙම දෙවන පරිච්ජේදය වෙනුවෙන් ම බව පැහැදිලිය.

ස්වසන්තාන දමන නම් වූ මේ දෙවැනි පරිච්ජේදය බුදුන් වහන්සේගේ පුරිස දම්ම සාරථී ගුණයට කිසිම සම්බන්ධ නැති පරිච්ජේදයක් වශයෙන් යමෙකුට තර්ක කළ හැකිය. එහෙත් ගුරුළුගෝමී ඉතා පරීක්ෂාකාරීව හා සියුම්ව එම පරිච්ජේදය පුරිස දම්ම සාරථී ගුණයට සම්බන්ධකරගෙන ඇත. පරිච්ජේදය අවසන් කරන ප්‍රකාශය එයට කදිම නිදසුනකි.

> "මහසත් වනාහි දස දහස් ලෝධා ගුගුරුවා අරුණු නැගෙනතුරු සව් කෙලෙස් පහා බුදු වී .................. මෙසෙයින් බුදුහු ගිනිගත් යපිඩෙක්හි අබ්ධා සෙයින් තමන් සතන් හි සිටි කෙලෙස් වසනා ලදවු නො තබා මඟ නුවණින් කඩා සව්නේ "දනෑ අනේක ජාතිං සංසාරං" යනාදීන් උදන් ඇනූ හ. [3]

අමාවතුරෙහි එන පළමු හා දෙවන පරිච්ජේද දෙක බුදුන් වහන්සේගේ පුරිස දම්ම සාරථී යන පදය සම්බන්ධකමක් නැති බව ඇතමෙකුගේ තර්කයයි. එහෙත් කතුවරයාගේ බලාපොරොත්තුව වූයේ බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු පමණක් ම තත් ගුණයන්ගෙන් යුක්ත වූ බව ප්‍රකට කරවීම නො වේ. පාරමිතා පුරන කල්හිදී අනුන් දමනය කළ අයුරු හා තමන් දමනය වූ අයුරු



දැක්වීම කතුවරයාගේ ඉදිරි කතා විකාශයට අනුග්‍රහයක් විය. එය ග්‍රන්ථයට සපයාගත් ප්‍රස්තාවනාවක් වැනිය. පශ්චාත් කාලීන විචාරකයන්ගේ ඇතැම් විමර්ශනයන්ගෙන් ද ඒ බව පෙනේ.

> අමාවතුර විමසා බැලීමේ දී කලාත්මක ලක්ෂණ අතින් මෙහි දක්නට ලැබෙන විවිධ විශේෂතා අගය කළ යුතුව ඇත. දුර්දාන්ත දමන නම් ප්‍රථම පරිච්ජේදය බෝසතාණන් පාරමී ධර්ම පූරණය කළ අවධියෙහි විෂමපුරුෂයන් දමනය කළ පරිදි ඉතා සැකෙවින් දැක්වීම සඳහා වෙන්වී තිබේ. මෙය ග්‍රන්ථාරම්භයට පෙරවදනක් වැනිය. [4]

> පුරිස දම්ම සාරථී යන පදයේ මුඛ්‍ය අදහසට ස්වසන්තාන දමනයේ සම්බන්ධයක් නැත්තා සේ ද පෙනී යන්නේ ය. එහෙත් දක්ෂ රචකයෙකුට කළ නොහැකි හාස්කමක් නැත්තේ ය. ස්වසන්තාන දමනය බුද්ධචරිතය කීමට ගුරුළුගෝමීන් විසින් වුවමනාවෙන් ම යොදාගත් උපක්‍රමයකි. එය සියුම් ව පුරිස දම්ම සාරථී පදයට සම්බන්ධ වී ඇති නිසා කතාවස්තු බීජය වශයෙන් ගත හැකි පුරිස දම්ම සාරථී පදයෙන් වෙන් කර කඩා ගැනීමට ද නො හැක්කේ ය. [5]

දුර්දාන්ත නම් පළමු පරිච්ජේදය බුද්ධ චරිතයට සම්බන්ධ නො වේ. එය බෝසත් චරිතයට සම්බන්ධ වූවකි. ස්වසන්තාන දමන නම් දෙවන පරිච්ජේදය බෝසතුන් තම චිත්ත සන්තානය දැමූ අයුරු විස්තරය සඳහා වෙන් වී ඇත. අමාවතුර කතුවරයා මේ පරිච්ජේද දෙක යොදා ගත්තේ බුදුන් වහන්සේගේ පුරිස දම්ම සාරථී පද වර්ණනාව විස්තර කිරීමට අවශ්‍ය වටපිටාව, පරිසරය සකස්කර ගැනීමක් වශයෙනි.

පරසන්තාන දමන නම් තෙවැනි පරිච්ජේදය ඍජුව ම අමාවතුර වස්තු විෂයට සම්බන්ධ වන්නේ ය. බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වීමේ පටන් දෙව්රම් වෙහෙර පිළිගන්නා තෙක් බුද්ධ චරිත කථාව සංක්ෂේපයෙන් එහි විස්තර කොට ඇත. දෙවියන්ගේ සැක දුරුකිරීමට යමා මහ පෙළහර පෑම, සත්සති ගත කිරීම, ධම්සක් දේශනාව, උපක - යස හමුවීම, තුම්බෑ ජටිලයන් දමනය කිරීම, රජගහනුවර වැඩීම, කිඹුල්වතට වැඩීම, ශාක්‍යයන්ගේ මානය බිඳීමට යමා මහ පෙළහර පෑම, ශාක්‍ය කුමරවරුන්ගේ පැවිද් ද, චන්දකින්නර ජාතක දේශනාව, සුදොවුන් රජුගේ ඉල්ලීම, දෙව්රම් වෙහෙර පිළිගැනීම තෙක් බුද්ධ චරිතයේ වැදගත් සිදුවීම්වල සංග්‍රහයක් ඒ පරිච්ජේදයේ එයි. පරිච්ජේදය අවසන් කරන්නේ වස්තු විෂයෙහි යෝග්‍යතාව හා අදාළත්වය සිහිපත් කරමිනි.

"මෙසෙයින් බුදුහු තමන් පුරිස දම්ම සාරථි වන බැවින් ධම්සක් පවත්නෙහි පටන් ගෙනැ අනේක ඍද්ධි ප්‍රාතිහාරයෙන් හා දේශනා විලාසයෙන් හා මහණ, දුළුලු, බමුණු, ගැහැවි, සැහැ රජ ආදි අනේසිය දහස් සතුන් සතන්හි දුලදු බිඳ දමා අමා මහ නිවන් පමුණුවමින් ගොස් අනේවඩු මහ සිටිහු සුපනස් කෙළෙක් ධන විසඳා කරන ලද දෙව්රම් වෙහෙර හැම බුදුන් වුසුතන්හි අමා රස වහන පුන් සඳක් සෙයින් විනෙ කුමුදු වන පුබුදුවමින් වැඩ වුසූහු. [6]

විෂම සත්ත්වයන් දමනය කිරීමෙහිලා බුදුන් වහන්සේ අනුගමනය කළ ක්‍රම කීපයකි. අමාවතුර කතුවරයා තත් ක්‍රමෝපායන් මෙහිදී මතක්කර දෙයි. එමතු ද නොව විවිධ වර්ගයේ තරාතිරම්වලට අයත් සතුන්ගේ නාමාවලියක් ද ඉදිරිපත් කොට ඇත. සෙසු පරිච්ඡේද ඉදිරියට කීමේ දී කතුවරයාට මේ පරිච්ඡේද අවසානය පූර්විකාවක් වී ඇති බව පෙනේ. සියුම් විවේක බුද්ධියෙන් කතුවරයා එම පූර්විකාව සකසා ගෙන ඇත. ප්‍රතිඥා පාඨයේ දී "දෙව්රම් වෙහෙර පිළිගෙනැ" යන පදය වෙන්කොට ඇත්තේ මේ තුන්වෙනි පරිච්ඡේදය සඳහා ය. බුදුවීමේ පටන් දෙව්රම් වෙහෙර පිළිගැනීම තෙක් බුද්ධ චරිතයේ වැදගත් සිදුවීම් සංග්‍රහ කිරීම තෙවැනි පරිච්ඡේදයට වෙන් කිරීමෙන් ම කතුවරයාගේ ආකෘතික පරිසමාප්තියේ නිරවුල්බව පැහැදිලි වෙයි.

අමාවතුර ප්‍රතිඥා පාඨයේ දී හතර වෙනුවට වැටෙන කාලපරිච්ඡේදය වන්නේ "තුන්ලෙව්හි සැරි සැරූ විෂම පුරිසයන් දමා" යන්නයි. තුන්වෙනි පරිච්ඡේදයෙන් පසුව පරිච්ඡේද පහළොවක් ම වෙන් වී ඇත්තේ බුදුන් වහන්සේ විවිධ අවස්ථාවල විවිධ ප්‍රදේශවල විෂම සත්ත්වයන් දමනය කළ ආකාරය පැහැදිලි කිරීමට යි.

ඒ ඒ පරිච්ඡේදයන්ගේ නම් අපි මුලින් සඳහන් කෙළෙමු. ඒ නාමයන් පිළිබඳව විමසිලිමත් වන අයෙකුට තුන්ලෙව්හි සැරි සැරූ යන්න තේරුම් ගැනීමට පුළුවන. දෙව්-බඹු, මිනිස් - යක් අසුර ආදී විවිධ සත්ව කොට්ඨාසයන් කෙරෙන් බුදුන් වහන්සේ පුරිස දම්ම සාරථි වූ අයුරු තෝරාගෙන ඇති කතා ප්‍රවෘත්තීන්ගෙන් පැහැදිලි ය. අදාන්ත වූ තිරශ්චීනගත සත්ත්වයන් ද බුදු කරුණාවෙන් සරණ සිල්හි පිහිට වූ අයුරු නාග දමන කතාවෙන් පැහැදිලි ය. අමාවතුර කතුවරයා ත්‍රිපිටකය පුරාවට පැවැති විවිධ කතා තෝරාගෙන බුදුන් වහන්සේගේ පුරිස දම්ම සාරථි ගුණය ප්‍රකට කොට ඇත. කාල, ප්‍රදේශ, හා සත්ත්ව අවස්ථාවන් පිළිබඳ දැඩි විමසීමකින් යුක්තව අමාවතුර රචනාකොට ඇති බව පෙනේ. තෝරාගෙන ඇති කතා වස්තු ම ඒ සඳහා පැහැදිලි නිදසුන් ය.



අමාවතුර ආකෘතියේ තවත් වැදගත් ලක්ෂණයක් වන්නේ කතුවරයා තෝරාගත් කතා ප්‍රවෘත්තියට සමාන තවත් කතා ප්‍රවෘත්ති ඇතොත් කතාව අවසානයේ දී "ආදී" ශබ්දයෙන් ඒ කතා ඉදිරිපත් කිරීමයි.

"මෙසෙයින් බුදුහු තමන් පුරිස දම්ම සාරථි වන බැවින් අඟුල්මල් සොරනුදු ආදී ශබ්දයෙන් සංකිච්ච නම් හෙරණපාණන් අතවැසි පන්සියයක් සොරනුදු, අතිමුත්තක නම් හෙරණපාණන් අතවැසි පන්සියයක් සොරනුදු, බානු කොණ්ඩඤ්ඤ මහ තෙරුන් අතවැසි පන්සියයක් සොරනුදු, කෙළදරුවන් කෙළරුවන් කසුබු මහ තෙරුන් අතවැසි නවසියක් සොරනුදු, මේ අය නො එක් සිය නො එක් දහස් සොරුන් දමා අමා මහ නිවන් පැමිණි වූහු" [7]

මේ රීතිය අමාවතුර සියලු පරිච්ඡේද අවසනයේ දැක ගැනීමට පුළුවන. සැබෙවි රීතියට එය ඉතා ම යෝග්‍යය. ආකෘතික ප්‍රතිඥාව නො බිඳ ඉදිරියට ගෙන ඒමකි.

කතුවරයා ග්‍රන්ථය නිමාකරන්නේ ද තමා කියූ කතා පුවත් නාමික ව දැක්වීමෙන් අනතුරුව යි. අවසන් ජේද නැවතත් බුදුගුණයෙහි අතුල්‍යත්වය දක්වා තමා කළ පිංකම අනුනට ද අනුමෝදන් කිරීමට යොදාගෙන ඇත. අවසන් ජේද දෙකින් මුල් ජේදයේ බුදුන් වහන්සේගෙන් දැමුණු කතානායකගේ නම් දැක්වීමටත් අවසන් ජේදය ඒ ඒ සත්වයන් අයත්වන වර්ග නැතහොත් පරිච්ඡේද වශයෙන් ඉදිරිපත් කළ පිළිවල දැක්වීමටත් යොදා ගෙන ඇත.

"මෙසෙයින් තුන් ලෙව්හි සැරි සැරූ උපාලි ගහපති ඈ සිටිනුදු, කූටදත්ත ඈ බමුණුදු, අජාසත් ඈ රජනිදු, අඟුල් මල් ඈ සොරනිදු ............ බක ඈ බමණුදු දමා අමා මහ නිවන් පමුණවමින් "............... [8]

"බුදු ගුණ අනන්ත වන බැවින් නවගුණ හැම කියත් නො පිළිවනින් එහි පුරිස ධම්ම සාරථි යන පදය ගෙන විස්තර කෙරෙමින් දුර්දාන්ත දමනය, ස්වසන්තාන දමනය, පරසන්තාන දමනය, ගහපති දමනය ............... බ්‍රහ්ම දමනය යන අටලොස් පරිච්ඡේදයකින් පිරිපුන් මේ ගත් කරන ............ " [9]

මෙලෙස අවසන් කරන අමාවතුර ආකෘතික පරිසමාප්තියෙන් යුත් ආදිතම සිංහල ගද්‍ය කාව්‍යය වේ. තම වස්තු විෂය පාඨකයා ඉදිරියේ දැක්වීමේ දී කිසි විටෙකත් ප්‍රතිඥා පාඨයෙන් බැහැර නො වී ය. නිරවුල් වස්තු විෂයක් පොත ආරම්භයේ සිට අවසානය තෙක් රැඳී ඇත. තම රීතියටත් ප්‍රතිඥාවටත්, පාඨක

පිරිසටත් මනා ව ගැළපෙන අයුරෙන් වස්තු විෂයික ආකෘතිකතාව රැකගෙන ඇත. පශ්චාත් කාලීන ලේඛකයන්ට නිරවුල් ආකෘතියක තරම හෙළි කළ ගුරූපදේශය වශයෙන් අමාවතුරේ වස්තු විෂයික ආකෘතිය පෙන්වා දීමට පුළුවන.

අමාවතුර කතුවරයාගේ පාඨක පිරිස කව්රුන් ද යනු ප්‍රතිඥා පාඨයෙන් පැහැදිලි කර දෙයි. "නොවියත් හුදී ජනන් සඳහා" යන පදයෙන් කතුවරයා අරමුණු කරගත් පාඨක පිරිස නම් සිංහල භාෂාව පිළිබඳ අවබෝධය නැති අය නො වේ. තත් කාලීන ව්‍යවහාරික සිංහල භාෂාව පිළිබඳ මනා අවබෝධයක් ඇති එහෙත් පාලි භාෂාව පිළිබඳ ගැඹුරු අවබෝධයක් නැති පිරිස නො වියත් හුදී ජනයා ය. පාළි භාෂාව ආශ්‍රයෙන් ත්‍රිපිටකය කියවා තේරුම් ගත නො හැකි ශ්‍රද්ධාවත් බෞද්ධ ජනතාව කතුවරයාගේ පාඨක පිරිස යි. මේ පාඨක පිරිස තත් යුගයේ ඉහළින් නැග ආ නිර්මාණවාදී සංකල්ප පිළිගත්, පිළිගන්නට පෙළඹුණු බෞද්ධ ජනතාව යි. හින්දු දහම සමාජයේ ව්‍යාප්ත වෙමින් ආ බමුණු දහම ඉහළින් පිළිගන්නට වූ යුගයක අමාවතුර කතුවරයා ඒ කෙරෙහි නැඹුරු වූ බෞද්ධ ජනයාට බුදුන් වහන්සේගේ අතුල්‍ය වූ ගුණ සම්භාරය පහදා දෙන්නට උත්සාහ ගත්තේ ය. නිවන්දම ධර්ම කීර්ති හිමියන් ප්‍රකාශ කරන්නේ බමුණු මතවාද ගත්තවුන් අමාවතුරෙහි දී දැඩි දෝෂ දර්ශනයට ලක්වූ බවයි. මේ අදහස ම අමාවතුර පාඨකයා කව්රුන්ද යනු සිතා ගැනීමට පිහිටක් වන්නේ ය.

> "ගුරුළුගෝමී කුලවාදයෙන් ඉදිමුණු හිස්ගෙඩි ඇති බමුණන් කෙරෙහි දක් වූ පිළිකුල ඒ දිට්ඨමංගලිකා වස්තුවෙන් පැහැදිලි වෙයි. ඔහු බමුණන් පිළිකුල් කළේ ඔවුන්ගේ කුලවාදය නිසා ද, නැත්නම් බමුණන් කෙරෙහි තමා තුළ පැවැති පෞද්ගලික තරහක් නිසා ද? ............. හින්දු සමයත් බුදුසමයත් එකිනෙකට විරුද්ධ වුණේ කුලවාදය නිසා යයි සිතමි................. සිරිතක් වශයෙන් හින්දු බෞද්ධ පැස්වරු මේ වාදය කරට ගෙන එකිනෙකා බැණ ගත්හ." [10]

මේ උධෘත පාඨයෙන් ධ්වනිත වන්නේ ගුරුළුගෝමීන් තත් යුගයේ හින්දු දහම ප්‍රචලිත කරවූ තැනැත්තන් ගර්හාවට ලක් කළ බවයි. බෞද්ධ ජනතාව අන්‍ය සාමයික සිද්ධාන්ත කෙරෙහි නැඹුරු වූ කල්හි එමගින් ඒ බෞද්ධ ජනතාව මුදවා ගැනීමේ පරමාර්ථයෙන් ඔවුන් පාඨක පිරිස වශයෙන් සිත්හි තබාගෙන ගුරුළුගෝමීන් අමාවතුර කළ බව පෙනෙයි.



> "අමාවතුර කතාව බමුණන්ටත් ඔවුන් පස්සේ දී වූ සැදැහැවතුන්ටත් එල්ල කරන ලද තියුණු පරිහාසයක් ගැප්කොට ඇතත් මහා භාරතයේ මාතංග කතාව බමුණන්ගේ උතුම්කමත් ශ්‍රේෂ්ඨත්වයත් වර්ණනා කරන්නකි ................ බමුණන්ටත්, දෙවියන් ලෙස සලකාගෙන ඔවුන්ගෙන් අනුශාසනයන් පිළිගත් රජුන්ටත්, ඇමතියන්ටත් අවමන් කරනු පිණිස රචිත කතා වස්තු බෞද්ධ සාහිත්‍යයෙහි සුලභ ය. එහෙත් බමුණන් ද ඔවුන් පස්සේ දී වූ රජුන් හා ඇමතියන් ඇතුලු සැදැහැවතුන් ද මලවන තරම් උග්‍ර උපහාස ගින්නක් ගැප්කොට ඇති මාතංග වස්තුවට සමකළ හැකි අනික් කථා වස්තුවක් බෞද්ධ සාහිත්‍යයෙහි නොදක්නා ලැබේ." [11]

යට සඳහන් විචාරක අදහස් දෙස විමසිලිවත්වන ඕනෑම අයෙකුට වාච්‍යාර්ථය ඉක්මවා ගිය ව්‍යාංගාර්ථය තුළ සැගවී සිටින අමාවතුර පාඨකයා කවරෙක් ද යනු නිශ්චිත කළ හැකිය. අමාවතුර රචිත යුගයේ සංස්කෘතික සංස්පර්ශය ද මෙහි දී අමතක කළ නො හැක. "නොවියත් හුදී ජනන්" යනුවෙන් කතුවරයා හඳුන්වාදෙන පාඨකයා නම් පෙළ දහමින් බුදු දහම අවබෝධ කර ගැනීමට නොහැකි වූ නිර්මාණවාදී සංකල්පයන්ගෙන් තම යථාර්ථවාදී දෘෂ්ටිය බැහැර කළ බෞද්ධ සිංහල ජනතාව ම බව සක් සුදක් සේ පැහැදිලි ය.

අමාවතුර ප්‍රතිඥා පාඨයේ සඳහන් "සියබස" පිළිබඳ ව මෙහි දී විමසා බැලිය යුතු ය. සියබස යනු තමන්ගේ භාෂාව යන්නයි. ගුරුළුගෝමී පඬිතුමා පොළොන්නරුපුර යුගයේ විසූ අයෙකි. ඔහුගේ භාෂාව සිංහල භාෂාව යි. ඔහුගේ අමාවතුර බස සුලලිත කෝමළ, ශිථිල භාෂාවකි. පාලියෙන් පද අරුත් සිංහල කොට තද්භව කොටගත් සරල බස් වහරකි අමාවතුරෙන් පැනෙන්නේ. ඇතමෙක් ගුරුළුගෝමීන්ගේ මේ භාෂාත්මක විචිත්‍රතත්වය නිසා ම ඔහු කාලිංගයකු කොට සලකති. ඔහුගේ භාෂාව කාලිංග එළුව යනුවෙන් සලකති. ගුරුළුගෝමීන්ගේ ග්‍රන්ථද්වය සලකන කල්හි පාලි - සිංහල - සංස්කෘත භාෂාවන්ගේ විශාරදත්වය මනා ව පැහැදිලි වේ. චරිත කතාවකට උචිත සුලලිත මධුර වාග් මාලාවක් අමාවතුරෙන් ද කෝෂ ග්‍රන්ථයකට ඔබින කඨෝර අශිථිල වාග්මාලාවක් ධර්මප්‍රදීපිකාවෙන් ද විෂද වෙයි. මෙහිදී අපගේ උත්සාහය වන්නේ "සියබස" යනුවෙන් අමාවතුර ප්‍රතිඥා පාඨයේ දී හඳුන්වා දුන් භාෂාව කවරක් ද යන්න පිළිබඳව අවබෝධයක් ලබාගැනීමයි.

> "අදහස් පැවසීමේ ගුරුළුගෝමීන් හෙළුව කොතරම් දක්ෂව යොදා ඇත් ද යනු දක්නට පුළුවන. හෙළුවහරේ අර්ථ ශක්තියේ තියුණු තරම පිරික්සිය යුතු නම් බැලිය යුත්තේ ගුරුළුගෝමීන් ගේ අමාවතුරෙහි එන හෙළුවයි. වරක් කියවා බැලූ දේ නැවැත කියවූ විට අලුත් හැඟීම් පාඨකයා තුළ දනවීම නිසා හෙළුව හුරු දනට අමාවතුර බස සැම විට ම නවතාවෙන් [illegible]" [12]

ගුරුළුගෝමී අමාවතුරේ දී යොදාගත් භාෂාව හුදු හෙළුවයි. එය නවතාවෙන් යුතුව කීප වරක් වුව ද කියවිය හැකි ය. සිංහල භාෂාවේ ජීව ගතිය දක්වාලූ කතුවරයෙකු වශයෙන් අමාවතුර කතුවරයා හැඳින්වුව වරදක් නොවේ. ව්‍යක්ත විශාරද ධර්ම කථිකයකුගේ ධර්මදේශනයකින් සමාධිගත වන්නෙකු මෙන් අමාවතුර පාඨකයා කතුවරයාගේ සියබසින් සන්තර්පණය වන්නේ ය.

> "බෞද්ධ සංස්කෘතියට ද බෞද්ධ රටක පරිසරයට ද ගැළපෙන්නේ වාග් ප්‍රපඤ්චයෙන් හා අලංකාරණයන් දූෂණය වුණු සංස්කෘත රීතිය නො ව පාලි රීතිය යි. එහෙයින් පාලි රීතිය ගුරුකොටගත් ගුරුළුගෝමීහු අතින් හැඩ ගැසුණු දේශීය මාර්ගයක් ලෙස සැලකිය යුතු අමාවතුර රීතිය නවීන කවර බසක වුව ද උසස් සරල රීතියට දෙවන නො වන්නකි." (13)

"සියබසින්" යනුවෙන් කතුවරයා ප්‍රකාශ කළේ කවරක් ද යන්න ඉහත විමර්ශනයන්ගෙන් පෙනේ. හුදු හෙළු වහර "සියබසින්" නිරූපිත යි. පාලි භාෂාවෙන් ඉතා සුළලිතව හැඩගසාගත් සිංහල භාෂාව අමාවතුරෙහි අර්ථ ශක්තිය තිව්‍ර කරයි. ශ්‍රවණයෙන් අර්ථ ග්‍රහණයට වඩා නිදහස් ව කියවීමෙන් පමණක් අමාවතුර භාෂාවේ අර්ථ ග්‍රහණය කරගත හැකි වන්නේ කියවීමේ දී පාඨකයා වෙහෙසට පත් නොකරන කෝමළ - ශිථිල - වාග් මාලාවකි අමාවතුර භාෂාව. අමාවතුරෙහි මේ "සියබස" පාලි - සංස්කෘත භාෂාවන් පිළිබඳ ගැඹුරු දැනුමක් නැති පාඨක පිරිසක් සඳහාම වේ. එබැවින් කතුවරයා ප්‍රතිඥා පාඨයේ දී සඳහන් කළ "සියබසින්" යනු හුදු සරල හෙළබස ම බව අවධාරණය කළ හැකි ය.

කතුවරයා තම ප්‍රතිඥා පාඨයේ දී සැබෙවින් යනුවෙන් අවධාරණය කළේ කුමක් ද යන්න පිළිබඳව විමසා බැලිය යුතුය. අමාවතුර කියවන කල්හි කතුවරයාගේ අභිමත වස්තු විෂය ග්‍රහණය කර ගැනීමේ දී "සැබෙවි" බවක් දක්නට නැත. සර්වාර්ථ සාධනයෙහිලා තත් වස්තු විෂය පොහොනේ ය. එසේ නම් කවරක් සැබෙවින් බලාපොරොත්තු වූයේ ද? චරිත කතාවක් ලෙසින් ඉදිරිපත් කෙරුණු අමාවතුරෙහි වස්තු විෂය පිළිබඳ විමසිලිමත් වන විට ඒ හා බැඳුණු සිදුවීම් කතුවරයා තම ග්‍රන්ථයේ දී විස්තර කිරීමට උත්සාහ ගත්තේ නැත. අනේක දේශනා විලාසයෙන් හා ඍද්ධි ප්‍රාතිහාර්ය බලයෙන් දමනය කළ සත්ත්වයන් විවිධය. ඒ සියලු සත්ව කොට්ඨාසයන් ඇතුළත් වන සේ කතා ප්‍රවෘත්ති තෝරාගෙන ඇත. එහි දී එක් ම වර්ගයකට අයත් තවත් දමුණු අය වෙතොත් ඒ අය සිහිපත් කර දෙන්නේ "ආදී" ශබ්දයෙන් ය. මෙය වස්තු විකාශයේ දී කතුවරයා අනුගමනය කළ සැබෙවි රීතියයි.



දුර්දාන්ත දමන නම් පළමු පරිච්ඡේදයේ දී කතුවරයා ප්‍රස්තුතයට අදාළ ජාතක කථා නාමාවලිවයක් ම ඉදිරිපත් කොට ඇත. ස්වසන්තාන දමන පරිච්ඡේදයේ දී දෙව්ලොවින් චුතව බුද්ධත්වය තෙක් චරිත විස්තරය ද පරසන්තාන නම් තෙවැනි පරිච්ඡේදයේ දී බුදුවීමේ පටන් දෙව්රම් වෙහෙර පිළිගැනීම තෙක් බුද්ධ චරිතයේ සංක්ෂිප්ත විස්තරය ද ඇතුළත් ය. තුම්බෑ ජටිලයන්ගේ දමනය පරිච්ඡේද දෙක තුනකට වුව ද ප්‍රමාණවත් ය. එහෙත් එක් පරිච්ඡේදයක සුළු කොටසකින් පමණ ඒ පුවත විස්තරය. එයයි කතුවරයාගේ වස්තුවිෂය විකාශයේ සැබෙවි රීතිය.

කතුවරයාගේ භාෂාව ද, වර්ණනා රීතිය සංක්ෂිප්ත ය. ඔහුගේ භාෂාව හා වර්ණනාව සංක්ෂිප්ත වුව ද අර්ථ උද්දීපනයේ දී සංක්ෂිප්ත බවක් නො දනේ. ගුරුළුගෝමීන්ගේ මේ සැබෙවි රීතිය පිළිබඳව විමසිලිමත් වූ සෑම විචාරකයෙකුගේ ම පැසසුම හිමිවිය.

> "ගුරුළුගෝමීහු කිව යුත්ත වචන ස්වල්පයකින් කියයි. වර්ණනාව වචන කීපයකින් කරයි. වර්ණනාවක් පිණිසවත් වැඩි මනත් අලංකාරෝක්තීන්ට නො බසියි. ඒ ගුරුළුගෝමීහුගේ දුර්ලභ කවිත්වයෙහි ශ්‍රේෂ්ඨාංගයකි. වචන හත අටකින් කියන ලද ගම්භීර විෂය පවා වහා වැටහෙයි." (14)

> "කිවයුතු දෙය අනවශ්‍ය වාග් බාහුල්‍යයෙන් තොර ව කොටින් පැහැදිලිව කිම ගුරුලුගෝමීන්ගේ ශෛලිය විය. එහෙයින් එය බොහෝ සෙයින් බුද්ධිමත් ජනයා විසින් අගය කළ හැකි ශෛලියකි." (15)

> "කියයුතු දෙය ඉතා කෙටියෙනුත්, පැහැදිලිවත් කිය හැකි උගතුන්ගෙන් ගුරුළුගෝමී අග්‍රගණ්‍ය ය. වෙන ග්‍රන්ථකාරයෙකුට පිටු ගණනාවකින් වුව ද කියවා නිමකර ගත නොහැකි වර්ණනයක් ගුරුළුගෝමී වැකි කීපයකින් වඩා ව්‍යක්තව කියයි." (16)

ඉහතින් සඳහන් කළ විචාරක මත විමසිල්ලට ලක් කරන විට ගුරුලුගෝමීන්ගේ සැබෙවි රීතිය අවබෝධ කර ගැනීමට පුළුවන. රචනා රීතියේත්, භාෂාවේත් සංක්ෂිප්තතාව ම කතුවරයා සැබෙවි යන පදයෙන් ධ්වනිත කරන්නේ ය. තමා වර්ණනා කරන අවස්ථාව හා සිද්ධිය පාඨකයාගේ සිතෙහි චිත්‍රණය කරන්නට තරම් එම සැබෙවි රීතිය පොහොනේ ය. අර්ථ රසයෙහි සංක්ෂිප්තතාව ම නො ව ශබ්දයෙහි හා රීතියෙහි සංක්ෂිප්තතාව ම එමගින් නිරූපිතය. අමාවතුරෙහි එක් ම වැකියක් ම ඒ සඳහා නිදසුන් වශයෙන් දැක්වීම ප්‍රමාණවත් වේ.

"සොර ක්ලාන්ත විය. මියෙහි කෙළ සිඳී ගියේ. ශරීරයෙන් ස්වේද බස්සී. එකල අඟුල් මල් සොර විස්මිතැව" මම් පූර්වයෙහි දිවෙන ඇතුන් ලුහුබැඳ ගනිම්මයැ .................. එතෙකුදු වුවත් මම් මේ මහණහු පියවි ගමනින් යන්නහු බල පමණින් දිවෙනුයෙම් හඹා නොගත හෙමි යි. (17)

අංගුලිමාල දමන කතාවෙහි එන මේ වර්ණනය පිටු ගණනක් දිගට ලිවිය හැකිය. මේ අවස්ථාව වෙනත් කතුවරයෙක් ඉතා දීර්ඝව ලියයි. එහෙත් තම ප්‍රතිඥා පාඨයට අනුව අමාවතුර කතුවරයා ඉතා ම කෙටියෙන් වර්ණනාවට හසු කර ගෙන ඇත. අර්ථ උද්ඝීප්තියෙහි සැබෙවි බවක් දක්නට නැත. අවස්ථානුකූල රසය පාඨකයාගේ සිත්හි මැවේ. වාග් චිත්‍රයක් සිත තුළ ඇඳේ. එහෙත් යොදා ගෙන ඇත්තේ ඉතා ම සීමිත වචන ප්‍රමාණයකි. එයයි අමාවතුර කතුවරයාගේ "සැබෙවි" රීතිය.

ඉහතින් දක් වූ කරුණු දෙස විමසිලිමත් වන විට අපට පැහැදිලිවන්නේ අමාවතුර කතුවරයා තම ප්‍රතිඥා පාඨයෙන් ප්‍රකාශිත අරමුණු ඔස්සේ ම ග්‍රන්ථය රචනා කර ඇති බවයි. මෙතරම් පිළිවෙල වූ මෙතරම් නිරාකූල වූ ආකෘතික පරිසමාප්තියෙන් යුක්ත වෙනත් ගද්‍ය ග්‍රන්ථයක් සිංහල සාහිත්‍යාවලියේ ම දක්නට නැති තරම් ය. ග්‍රන්ථය ආරම්භයේ සඳහන් කළ ආකෘතික පිළිවෙල ඉක්මවන්නට කතුවරයා කිසිවිටෙකත් උත්සාහ දරා නැත. එබැවින් ම අමාවතුර කීපවරක් වුව ද නවතාවෙන් යුතු ව කියවිය හැකි ය. අමාවතුරෙහි මේ ආකෘතික පරිසමාප්තිය ග්‍රන්ථයට කැණිමඩලක් ය. මුතු පටක ඇමුණු නූලක් මෙන් ය. පොත ආරම්භයේ දී කතුවරයා දුන් ප්‍රතිඥාවට අනුව පොතේ හැම ඡේදයක් ම, පිටුවක් ම, වැකියක් ම ලියා ඇත. එය දක්ෂ ග්‍රන්ථ කාරයෙකුගේ විශිෂ්ට නිමවුමකි. පශ්චාත් කාලීන ලේඛකයන්ට ආකෘතිය නිමැවුම පිළිබඳ ගුරු උපදේශ සපයන ග්‍රන්ථය වශයෙන් අමාවතුර හැඳින්වීම යුක්ති යුක්තය. සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථ අතර සම්පූර්ණවූත්, පැහැදිලිවූත්, නිරවුල්වූත් ආකෘති පරිසමාප්තියෙන් යුත් ග්‍රන්ථ අතර අග්‍රස්ථානය නිසැකයෙන් ම අමාවතුර හිමි කර ගනී. අමාවතුරෙහි මේ ආකෘතික පරිසමාප්තිය ලප කැළැල් නො මැති රූප සුන්දරියකි. ගත් කරුවන්ට මාර්ගෝපදේශ සපයන ගුරුවරයෙකි. අමාවතුර කතුවරයාගේ නිදහස් චින්තනයට හා අනර්ඝ කවිත්වයට අසම සම උපමාවකි.

පාදක සටහන්

| | |
|---|---|
| 1. අමාවතුර, සංස් .- | වැලිවිටියේ සෝරත හිමි, අභය ප්‍රකාශකයෝ, ගල්කිස්ස, 1972, පිටු අංක 01 |
| 2. අමාවතුර - එම .- | පිටු අංක 05 |
| 3. අමාවතුර - එම .- | පිටු අංක 31 |



| | |
|---|---|
| 4. සිංහල සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රදීපිකා .- | හොරණ වජිරඤාණ හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1992, පිටු අංක 104 |
| 5. පොළොන්නරු පුර සාහිත්‍යය.- | ඩබ්ලියු. කරුණාරත්න, රත්න පොත් ප්‍රකාශකයෝ, මරදාන, 1998, පිටු අංක 142. |
| 6. අමාවතුර - එම .- | පිටු අංක 97 |
| 7. අමාවතුර සංස්. .- | කෝදාගොඩ ඤාණාලෝක හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 1998, පිටු අංක 142. |
| 8. අමාවතුර - එම | පිටු අංක 303 |
| 9. අමාවතුර - එම | පිටු අංක 304 |
| 10. සිංහල සාහිත්‍යයේ ස්වර්ණ යුගය .- | නිවන්දම ධම්කිර්ති හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2002, පිටු අංක 98-99. |
| 11. සිංහල සාහිත්‍යයේ නැගීම .- | මාර්ටින් වික්‍රමසිංහ, තිසර ප්‍රකාශන, දෙහිවල, 1997, පිටු අංක 75 - 76. |
| 12. සිංහල සාහිත්‍ය වංශය .- | පී. බී. සන්නස්ගල, ලේක්හවුස් මුද්‍රණාලය, කොළඹ, 1961, පිටු අංක 608 |
| 13. සිංහල සාහිත්‍යයේ නැගීම .- | මාර්ටින් වික්‍රමසිංහ, සමන් මුද්‍රණාලය, මහරගම, 1962, පිටු අංක 07 |
| 14. සාහිත්‍යෝදය කතා .- | මාර්ටින් වික්‍රමසිංහ, තිසර ප්‍රකාශන , දෙහිවල, 1991 , පිටු අංක 24. |
| 15. සිංහල ලේඛක පරපුර .- | කේ. ඩී. පී. වික්‍රමසිංහ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1964 පිටු අංක 116. |
| 16. සිංහල සාහිත්‍යයේ ස්වර්ණ යුගය.- | එම- පිටු අංක 92. |
| 17. අමාවතුර - සංස්. .- | වැලිවිටියේ සෝරත හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2000, පිටු අංක 91 |